# ඉගැන්වීමේ තාක්ෂණය සහ ක්‍රමවේදයන් පිළිබඳ වෘත්තීය ඩිප්ලෝමා පාඨමාලාව

# Professional Diploma in Teaching Technology & Methodology (PDTTM)

## ( 5th Intake - 2017 )

## ශ්‍රී ලංකාවේ පිළිගත් ජාතික විශ්වවිද්‍යාලයකින් ගුරු වෘත්තිය පිළිබඳ වෘත්තීය සුදුසුකමක් සපුරා ගැනීමට සුවිශේෂී අවස්ථාවක්

---

### කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය – ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය
### Staff Development Centre – Wayamba University of Sri Lanka

### පාඨමාලා විස්තරය

- දැනට ගුරු වෘත්තියේ නියැලෙන හා නියැලීමට අපේක්ෂිත අය සඳහා වූ වෘත්තීය පාඨමාලාවකි. ඉගෙනුම් න්‍යාය, ඉගැන්වීමේ ක්‍රමවේදයන්, අධ්‍යාපන දර්ශනය, අධ්‍යාපන මනෝවිද්‍යාව, ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනය, ඇගයීම් ක්‍රම සහ තොරතුරු තාක්ෂණ ක්‍රමවේදයන් ඇතුලත් සති 24 ක සති අන්ත පාඨමාලාවකි. (සෙනසුරාදා දින පමණි.)
- කාර්මික විද්‍යාල සහ වෙනත් අධ්‍යාපන ආයතනවල කථිකාචාර්යවරුන් සහ උපදේශකවරුන් සඳහා වූ කඩඉම් සුදුසුකමක් ලෙස පිළිගත් පාඨමාලාවකි.
- සුදුසුකම් හා පලපුරුද්ද සහිත ප්‍රවීණ විශ්වවිද්‍යාල ආචාර්ය මඩුල්ලක් විසින් මෙහෙයවනු ලබන ඉගැන්වීමේ තාක්ෂණය හා ක්‍රමවේදය පිළිබඳ සෛද්ධාන්තික හා ප්‍රායෝගික න්‍යායන් ඇතුලත් පාඩම් මාලා 24 ක්
- සියළු පහසුකම් සහිත ශ්‍රවණාගාර, ප්‍රවීණ හා නවීන ඉගැන්වීමේ ක්‍රමවේද හා ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයක් සහිතව සිදුකරන පැය 150 ක් සම්පූර්ණවන පාඨමාලා කාලසීමාවක්, සතිඅන්ත පාඨමාලාවකි (කාලය මාස 6).
- ඉගෙනුම් කාර්යසාධන වාර්තාවක් සහ වාචික ඉදිරිපත්කිරීම් පාදක කරගත් අවසාන ඇගයීම් ක්‍රමය, (ලිඛිත පරීක්ෂණ නැත.)

### සුදුසුකම්

අ.පො.ස උසස් පෙළ ඕනෑම විෂය ධාරාවකින් විෂයයන් 2 කින් සමත්ව තිබීම ( විෂයයන් 4 ක් සඳහා පෙනීසිටි සිසුන් ඉන් තුනකින් සමත්ව තිබීම. ) හෝ අ.පො.ස සා.පෙළ සමත්වීම හා පොදු/ අර්ධරාජ්‍ය/ රාජ්‍යනොවන/පුද්ගලික ආයතනයක වසර 02 ක වෘත්තීය පලපුරුද්ද හෝ විශ්වවිද්‍යාලීය සනාතන සභාව මගින් පිළිගත් ඕනෑම සුදුසුකමක්.

### කාලසීමාව

2017 ජනවාරි මස මැද භාගයේ ආරම්භවන සයමාසික වැඩසටහන. ( සෑම සෙනසුරාදා දිනකම උදෑසන 8.00 සිට සවස 4.30 දක්වා )

### ස්ථානය

කාර්යමණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය, මාකඳුර, ගෝනවිල

### පාඨමාලා ගාස්තු

රු. 35,000 (දේශණ ගාස්තු + ලියාපදිංචි ගාස්තු + විභාග ගාස්තු ) පාඨමාලා ගාස්තු ගෙවීම අවස්ථා 02 කින් සිදුකිරීමට අවස්ථාව ලබාදේ.

### බඳවාගැනීමේ අයදුම්පත්

http://sdc.wyb.ac.lk යන වෙබ් අඩවියට පිවිසීමෙන් හෝ sdc@wyb.ac.lk යන විද්‍යුත් තැපැල හරහා අයදුම්පත් ලබාගත හැක. නැතහොත් පහත දැක්වෙන ලිපිනයට තම නම සහ ලිපිනය ලියන ලද මුද්දර ඇලවූ ලියුම් කවරයක් එවීමෙන් එය ගෙන්වා ගත හැක. අයදුම්පත් භාරදීමේදී රු. 250 ක ගාස්තුවක් අය කරනු ලැබේ.

**අයදුම්පත් භාරගන්නා අවසන් දිනය: 2016 දෙසම්බර් 31**


**වැඩිදුර විස්තර සඳහා**

බී.පී.ජ්. ජයවීර මයා ( අධ්‍යක්ෂ, කාර්යමණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය)

(031) 229 9873 (කාර්යාල) විද්‍යුත් තැපැල: sdc@wyb.ac.lk, හෝ

ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී/ පොදු සහාය ඒකකය ( පාඨමාලා පාලන සම්බන්ධීකාරක,)

(031) 229 8111 ( කාර්යාල); ෆැක්ස්; (031) 229 8111

ලිපිනය :- අධ්‍යක්ෂ, කාර්ය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය, මාකඳුර, ගෝනවිල, 60170